පී. ඒ. ලෙස්ලි ගාමිණී
රේගු මාධ්‍ය ප්‍රකාශක / රේගු අධ්‍යක්ෂ
රේගු මාධ්‍ය ප්‍රකාශක



# රේගුවයි ඔබයි 4

## ශ්‍රී ලංකාවෙන් පිටරට යාමේ දී මගීන්ට ලැබෙන පහසුකම්

ශ්‍රී ලංකාවෙන් පිටරට යන මගියකුගේ පෞද්ගලික ගමන් බඩු සඳහා කිසිම තීරු බද්දක් අය කරනු නොලැබේ. එහෙත් අපනයන බලපත්‍රයකින් තොරව වාණිජමය ස්වරූපයෙන් භාණ්ඩ ගෙන යාමට අවසර නැත. නැවත ආපසු මෙරටට පැමිණෙන මගියකුට බලපත්‍රයකින් තොරව ස්වර්ණාභරණ පැළඳ ගෙන යා හැකි වී. එහෙත් නිම නොකළ හෝ අර්ධ වශයෙන් නිම කළ රන් හෝ ස්වර්ණාභාරන පැළඳ ගෙන හෝ සඟවා ගෙන යා නොහැකිය. සාමාන්‍ය මගියෙකුට රුපියල් 10,000 ක් වටිනා වාණිජමය ස්වරූපයේ නොවන දේශීය නිශ්පාදන පිටරට රැගෙන යා හැකිය.

ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවන් වන බැහැර යන නිර්ව්‍යාජ මගීන්ට, ආපසු රැගෙන එන පදනම මත, නිර්ව්‍යාජ ස්වර්ණාභරණ පැළඳගෙන තම සන්තකයේ රැගෙන යා හැකිය. ඉහත කී ආභරණ සියල්ල කර්මාන්තයෙන් නිපයූ නිර්ව්‍යාජ පුද්ගලික භාණ්ඩ විය යුතුය. මීට අමතරව විදේශීක මගීන්ට ඔවුන් සතු ආභරණ ආපසු රැගෙන යාම අවශ්‍ය වන ආකාරයට හා අවශ්‍ය වන විට ඔවුන් මෙරටට පැමිණීමේ දී ඒවා රේගුවට ප්‍රකාශ කළ යුතුය.

ඉහත දැක්වෙන විධිවිධනවලට පටහැනිව ක්‍රියාකරන අවස්ථාවන්හි දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රේගු ආඥා පනත් විධිවිධානයන්ට අනුකූලව එක් එක් මගියකු උදෙසා ස්වකීය අභිමතය ක්‍රියාත්මක කර සුදුසු පරිදි නීති මගින් කටයුතු කරනු ලබනවා ඇත.

මෑත අතීතයට අයිති කෞතුක භාණ්ඩ වන වැදගත් ලේඛනල කලාකෘති, ගෘහ භාණ්ඩල පැරණි රෙදිපිළි මෙන්ම, ඉපැරණි බුදු පිළිම, පුස්කොළ පොත්, පැරණි කාසි වර්ග, ස්වර්ණාභරණ, ගල් කැටයම්, ඇත්දළ, කලුවර කැටයම්, ලී කැටයම්, මැටි සහ පිගන් භාණ්ඩ, පිත්ත, සහ ලෝකඩ කැටයම්, මූර්ති ආදි විවිධ ස්වරූපයේ පුරා වස්තු සහ ජාතික ලේඛන මෙරටින් හොර රහසේ පිටමං කිරීම තහනම් වේ. තමන් රැගෙන යන සෑම භාණ්ඩයක්ම රේගුවට ප්‍රකාශ කළ යුතු අතර, තහනම් භාණ්ඩ රැගෙන යාමට ඉඩ නොදේ. සීමා කරන ලද භාණ්ඩ සඳහා බලපත්‍රයක් අවශ්‍ය වේ.

## තැපැලෙන් ශ්‍රී ලංකාවට තෑගි භාණ්ඩ යවන ආකාරය

තෑපැලෙන් යවනු ලබන ත්‍යාග භාණ්ඩ ලබා ගැනීම සඳහා කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි මධ්‍යම තැපැල් හුවමාරු මධ්‍යස්ථානයේ පිහිටි රේගු කාර්යාලයට යා යුතුවේ. මෙම ස්ථානයේ දී මුහුදු තැපැල්, ගුවන් තැපැල් හා පැකට් ආකාරයෙන් හා අධිවේග තැපැල් ත්‍යාග භාණ්ඩ ශ්‍රී ලංකාවට යැවිය හැකිය. මෙහි දී අයිතිකරු ඉදිරිපිට දී රේගු නිලධාරියකු වීසින් පාර්සලය විවෘත කරනු ලැබේ. වටිනාකම රු. 15,000 කට වඩා අඩු සාමාන්‍ය තෑගි භාණ්ඩ තීරු බද්දෙන් තොරව නිදහස් කරනු ලබන අතර, වාණිජමය ස්-වරූපයෙන් එවන භාණ්ඩ හෝ තහනම් හෝ සීමා කරන ලද භාණ්ඩ සඳහා මෙම වරප්‍රසාදය හිමි නොවේ. මෙම වරප්‍රසාදය හිමිවන්නේ හය මසකට වරකි. රු. 15,000 ඉක්මවන්නේ නම් ඒ සඳහා තීරු බදු අය කරනු ලැබේ. බලපත්‍ර අවශ්‍ය වන භාණ්ඩ සඳහා අදාල බලපත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ත්‍යාගය යැවූ තැනැත්තාටම ආපසු එවනු ලැබේ.

පිටරට සිටින පුද්ගලයකු විසින් ශ්‍රී ලංකාවේ සිටින තමාගේ හිතවතකුට හෝ ඥාතියකුට ත්‍යාගයක් එවන්නේ නම් කොළඹ හා කොළඹින් පිට පිහිටි ස්ථාන වලට එවීමට ද පුලුවන. තමා ත්‍යාගය එවන පුද්ගලයා සිටින රටේ තිබෙන නියෝජිත කාර්යාලයට භාර දීමෙන් පසු මෙම භාණ්ඩ කොළඹ, වත්තල, ඩී. ආර්. විජේවර්ධන මාවත, බ්ලූමැන්ඩල් පාර, පෑලියගොඩ නුගේ පාර ආදි ස්ථානවලට මෙන්ම, නුවර, කුරුණෑගල, ගාල්ල, දඹුල්ල, නින්දවූර් හා අට්ටාලචේනෙයි යන ස්ථානවලට ද මෙම භාණ්ඩ එවිය හැකිය. ත්‍යාග භාණ්ඩ සඳහා තීරු බදු හා අනෙකුත් බදු අයකරනු ලැබේ.

**KIRIBATHGODA**
**FULLY FURNISHED HOLIDAY HOME**

The house is located in a very calm and quiet area with a peaceful environment.
Best residential area 30 mins drive to Colombo City limits / Biyagama FTZ / Airport, and just 4 mins walking distance to Kandy road at the heart of Kiribathgoda town centre (with Banks, Supermarkets, shopping outlets, restaurants and public transport.)

- Fully furnished single storey house with 4 spacious bedrooms, separate kitchen, dining room, very large living room and 2 attached bathrooms + outside rest room.
- AC + Ceiling Fans in all bedrooms.
- Gas/Electric cooking, hot and cold water.
- Kitchen utensils, fridge, gas oven, Convection microwave, top loader washing machine, TV and DVD player provided.
- Easy maintenance with Solar Electricity + Solar Hot water
- 2 Car parking spaces.(2 under cover)

Inquiries: Cecil / Neil: 02 9636 3096 /
Email: samaratunga2014@gmail.com for further details.

**Available from July 2014.**

Approved by Sri Lanka Tourist Board, as a "Holiday Home".

Rent: Negotiable on short term basis

LANKAN AUTO CARE
Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886
9798 2200
14/30 Tower Court
Noble Park 3174